# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,254 - 2021 නොවැම්බර් මස 12 වැනි සිකුරාදා - 2021.11.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 580 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 581 |


*සැ. යු.*- (i) ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2021 ඔක්තෝබර් මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 දෙසැම්බර් මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 නොවැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

## මහනුවර දිසා අධිකරණයේ දීය

### විකිණීමේ දැන්වීමයි

මහනුවර දිසා අධිකරණයේ නඩු අංකය : DMB 00018/17

ඇස්කීසි අංකය : 74/2021

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

*පැමිණිලිකාර සමාගම.......*

*එදිරිව :*

1. නම්මුනි රංජිත් අශෝක ද සොයිසා,
අංක 177/2, අළුත්වත්ත,
රජවැල්ල.

*විත්තිකරු..........*

වර්ෂ 2019 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් අසූ දෙලක්ෂ නවදහස් අටසිය හතළිහක (රු. 8,209,840.00) මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ, හා උ ඡේදයන් හි සහනයන් ද ලබාගැනීම සඳහා ආඥා කොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් අසූ දෙලක්ෂ නවදහස් අටසිය හතළිහක (රු. 8,209,840.0) මුදල සහ එකී මුදල මත 2017.04.18 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා 20% බැගින් පොළිය ද, පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයක් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපළෙන් උපදන සහ එකතුවන සියලු කුළී ලාභ සහ අනෙකුත් ආදායම් ද, සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ, නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කීසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

වර්ෂ 2021 ක්වූ දෙසැම්බර් මස 23 වැනි දින ප. ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව කුළුගම්මන සියපත්තුව හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ පහළ බොකලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොකලවෙල ගමෙහි පිහිටි දිසානැක්ගෙදර වත්ත, රඹුක්වැල්ලේ ගෙදර වත්ත, වාකොටුව උඩ අරඹ හේන, අලකොලදෙනිය වත්ත හා කැප්පෙටියේ හේන නමැති එකට යාවූ ඒකාබද්ද ඉඩමට මහනුවර දිසා අධිකරණයේ පැවති අංක 4048 බෙදුම් නඩුවේ අවසාන තීන්දුව සඳහා ආර්. සී. ඕ. ද ලා මොත්තේ අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 1954 ක්වූ සැප්තැම්බර් මස 18 වැනි දින මැන බෙදා වෙන්කර සාදන ලද අංක 745 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 02 දරන කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ කැබලි අංක 01 ද, නැගෙනහිරට : අලකොලදෙනිය කුඹුර ද, දකුණට : එකී පිඹුරේ කැබලි අංක 03 හා දීගල වත්ත ද, බස්නාහිරට : එකී පිඹුරේ කැබලි අංක 04 යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් පහළොවයි දශම දෙකක් (අ.0, රූ.03, පර්. 15.2ක්) විශාල ඉඩම (නොබෙදූ පර්චස් 12ක් අත්හැර) සහ එහි පිහිටා ඇති නිවස ඇතුළුව ඊට අයත් ගසකොළ, පළතුරු ආදී සියලු දේත් සමග මෙම ඉඩමට ප්‍රවේශ වීමට ඇති මාර්ගයේ මාර්ග පරවශතා අයිතිය ද වේ.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව කුළුගම්මන සියපත්තුව හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ පහළ බොකලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොකලවෙල ගමෙහි පිහිටි අලකොලදෙනිය කුඹුර නැමැති ඉඩමට ඒ. ආර්. ටී. ගුරුසිංහ අවසරලත් මිනින්දෝරුතැන විසින් වර්ෂ 2010.10.28 සාදන ලද අංක 3809 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන කොටසට මායිම්, උතුරට සහ නැගෙනහිරට : අලකොලදෙනියේ කුඹුරේ ඉතිරි කොටස ද, දකුණට : බොකලවෙල - අඹතැන්න පාර ද, බස්නාහිරට : බී. එම්. ලොකු බණ්ඩාට අයත් දීගල ගෙදර වත්ත වෙන්වන ඇල්ල හා ආර්. සී. ඕ. ද ලා මොත්තේ අවසරලත් මානක තැනගේ අංක 745 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම එකයි හතක් (අ.0, රූ.0, පර්. 5.17ක්) *හෙවත්* හෙක්ටයාර් 0.0130ක් විශාල ඉඩම හා ඊට අයත් ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක T 53/128 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

පී. අයි. මාරසිංහ,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
සාමවිනිසුරු,
දිසා අධිකරණය - මහනුවර.

වර්ෂ 2021 ක්වූ ඔක්තෝබර් මස 26 වැනි දින දී ය.

11-433

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කෝකිලා හර්ෂණී ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීමයි :-

01. සංවර්ධනයට අදාළ සියලු ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය, පුහුණුව හා සංවර්ධනය මගින් මානව සම්පත් මැනවින් හා වඩා ඵලදායී ලෙස උපයෝජනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

02. පුහුණු කිරීමේ වෘත්තීය සඳහා නියෝජිත ආයතනයක් සැපයීම හා එහි නඩත්තු සඳහා අනුග්‍රහය දැක්වීම සහ පුහුණු කිරීමේ වෘත්තීය යහපත හා වැඩි දියුණුව සඳහා තොරතුරු, අදහස්, ක්‍රම විධි, ශිල්පීය ක්‍රම එකතු කිරීම, සංසන්දනය කිරීම, සම්බන්ධීකරණය හා බෙදා හැරීම ;

03. සංවිධානවල කළමණාකාරීත්වය නිපුණතා මට්ටම දියුණු කිරීම අරභයා සංවිධාන මට්ටමින් මානව සම්පත් සංවර්ධන අභිලාෂයන් ක්‍රියාකාරී අන්දමින් ප්‍රවර්ධනය කිරීම යනාදිය වේ.

කෝකිලා හර්ෂණී ගුණවර්ධන,
පාර්ලිමේන්තු මන්ත්‍රිනී,
ගම්පහ දිස්ත්‍රික්කය.

11-205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.